SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර III විභාගය - 2026 ජූලි

## යෝජිත උත්තර

# (3803) අවධානම පාලනයන් සහ විගණනය (RCA)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන : 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර 03 විභාගය - 2026 ජූලි**

**(3803) අවධානම පාලනයන් සහ විගණනය**

# යෝජිත උත්තර

**(මුළු ලකුණු 20)** **A කොටස**

## *1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය** 01

**නියෝජ්‍යත්ව න්‍යායය**

සම්පත් හිමිකරුවෙකු හෝ සම්පත් සපයන ප්‍රධානියෙකු සහ ප්‍රධානියා වෙනුවෙන් ක්‍රියා කිරීමට පත් කරන ලද නියෝජිතයෙකු අතර සම්බන්ධතාවය නියෝජ්‍යත්ව න්‍යාය තුලින් පැහැදිලි කරයි. ලැයිස්තුගත සමාගමක් සම්බන්ධයෙන් ගත් කල කොටස් හිමියන් ප්‍රධානීන් වන අතර, අධ්‍යක්ෂවරුන්/කළමනාකරුවන් නියෝජිතයන් වේ. නියෝජ්‍යත්ව ගැටුමක් ඇති නොවන පරිදි නියෝජිතයින්ට ප්‍රධානීන්ගෙන් ඉටු විය යුතු විවිධ අවශ්‍යතා පවතින බව මෙම න්‍යාය හඳුනා ගනී. එබැවින්, කළමනාකරුවන්/අධ්‍යක්ෂවරුන් (නියෝජිතයින්) කොටස් හිමියන්ගේ (ප්‍රධානීන්ගේ) හොඳම අපේක්ෂාවන් වෙනුවෙන් ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා අධීක්ෂණ සහ ආයතනික පාලන යාන්ත්‍රණ අවශ්‍ය වේ.

**භාරකාරීත්ව න්‍යායය**

කොටස් හිමියන්ට අයත් සමාගමක කළමනාකරුවන්/අධ්‍යක්ෂවරු එම සමාගමේ සම්පත් පිළිබඳ භාරකරුවන් ලෙස කටයුතු කරන සම්බන්ධතාවය, එනම් සංවිධානයේ සහ එහි කොටස් හිමියන්ගේ (ප්‍රධානීන්ගෙ) යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට කොටස් හිමියම් විසින් අධ්‍යයක්ෂක මණ්ඩලය විශ්වාස කරන බව භාරකාරත්ව න්‍යාය පැහැදිලි කරයි. කළමනාකරුවන් ඔවුන්ගේ පුද්ගලික ප්‍රතිලාභවලට වඩා ආයතනයේ සාර්ථකත්වය, දිගුකාලීන කාර්ය සාධනය සහ කොටස් හිමියන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පෙළඹී ඇති බවට භාරකාරත්ව න්‍යාය උපකල්පනය කරයි. එමනිසා, මෙම න්‍යාය මගින් අවධාරණය කරන්නේ කළමනාකරුවන්/අධ්‍යක්ෂවරුන් දැඩි අධීක්ෂණයට ලක් කරනවා වෙනුවට විශ්වාසය, බලගැන්වීම සහ සහයෝගය තුලින් තම කොටස් හිමියන් කෙරෙහි තම භාරකාරත්ව වගකීම ඉටු කරන බවයි.

***(මුළු ලකුණු 05)***

## *2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**පරිච්ඡේදය** 04

**i.** මූල්‍ය ප්‍රකාශන විගණනය (ව්‍යවස්ථාපිත විගණනය)

**අරමුණ:**

මූල්‍ය ප්‍රකාශන විගණනයක මූලික අරමුණ වන්නේ, සීමාසහිත Best පොදු සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන නියමිත ප්‍රමාණාත්මක ආකාරවලින් පිළියෙළ කර තිබේද යන්න සහ ඒවා අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව ව්‍යාපාරයේ සැබෑ මූල්‍ය තත්වය පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන්නේද යන්න පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම සඳහා ස්වාධීන විගණකවරයෙකු ලෙස ABC වරලත් ගණකාධිකාරී ආයතනයට හැකියාව ලබා දීමයි.

**අනුකූලතා විගණනය**
**අරමුණ:**

ii. අනුකූලතා විගණනයක මූලික අරමුණ වන්නේ, සීමාසහිත Best පොදු සමාගම අදාළ නීති, රෙගුලාසි, ගිවිසුම්ගත බැඳීම්, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අනෙකුත් නියමිත අවශ්‍යතා සියල්ලටම අනුකූල වී ඇත්ද යන්න සහතික කිරීමයි.

***(මුළු ලකුණු 05)***

## *3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| **පරිච්ඡේදය 02** |
|---|

**(a)**

- එලදායී ලෙස විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා.
- ඉහළ අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා
- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව ඇගයීම සඳහා
- මූල්‍ය තොරතුරු වල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා

(ක්‍රම දෙකක් පමණක් අපේක්ෂා කෙරේ)

***(ලකුණු 02)***

**(b)**

- පුනරාවර්තන ව්‍යාපාරික කාර්යයන් ස්වයංක්‍රීය කිරීමෙන් කාර්යක්ෂමතාව සහ එලදායිතාව වැඩි දියුණු කළ හැකිය.
- නිරවද්‍යතාවය සහ විනිවිදභාවය වැඩි දියුණු කරන අතරතුර මිනිසුන් අතින් සිදු කිරීමේදී ඇතිවන වැරදි අඩු කළ හැකිය.
- ශ්‍රම පිරිවැය අඩු කිරීම සහ වැරදි අවම කිරීම ඉතිරිකිරීම් සඳහා හේතු වේ
- කෘතීම බුද්ධිය (AI) සහ යන්ත්‍ර ඉගෙනීම (ML) ව්‍යාපාරික තීරණ වැඩිදියුණු කරන තීක්ෂ්ණ බුද්ධිය ලබා දීම සඳහා විශාල දත්ත ප්‍රමාණයක් විශ්ලේෂණය කරයි
- දැනුවත් සේවකයින්ට අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම් වල නියැලීමට හැකිය, විශේෂයෙන් තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැනි.
- මෙම ඩිජිටල් මෙවලම් හරහා සන්නිවේදනය සහ තොරතුරු බෙදාගැනීම විධිමත් කිරීමෙන් දෙපාර්තමේන්තු සහ සංවිධාන අතර වඩා හොඳ සහයෝගීතාවයක් ඇති කරයි.
- ව්‍යාපාරවලට අකාර්යක්ෂමතා සහ වැඩිදියුණු කල යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමෙන් සම්පත් එලදායී ලෙස වෙන් කිරීම මගින් සම්පත් ප්‍රශස්තිකරණය ලබා ගත හැකිය.
- කෘතීම බුද්ධිය (AI) සහ රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA) මගින් පාරිභෝගිකයන්ට වැඩිදියුණු කළ අත්දැකීම් ලබා දෙමින් පුද්ගලීකරණය සහ ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කළ හැකිය.
- සැලකිය යුතු පිරිවැය අඩු කිරීමක් ලගා කර ගත හැකිය.
- එය නවෝත්පාදනයන් දිරිමත් කරයි.
- එය වඩා හොඳ ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා උපකාරී වේ.

(වාසි තුනක් පමණක් අපේක්ෂා කෙරේ)

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 05)***

## *4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 03 |
|---|

**(a)**

- මෙහෙයුම් අවදානම

ව්‍යාපාරයක් තම පාරිභෝගිකයනට භාණ්ඩ හා සේවා ලබා දීම මග හැරවන හෝ ඕනෑම පුද්ගලයෙක්, කණ්ඩායමක්, බලවේගයක්, තොරතුරු පද්ධති බිඳවැටීමක්, හෝ යන්ත්‍ර දෝෂයක් මෙහෙයුම් අවදානමක් ලෙස හඳුනාගත හැක.

මෙම අවස්ථාවට අනුව, අඩු වියදම් ආනයන වැඩි වීම Mark පොදු සමාගමෙහි තරගකාරී තත්ත්වය දුර්වල කිරීමට හේතු වන අතර එය ලාභදායිතාවයේ පහත වැටීමට හේතු වේ.

- වංචා අවදානම

සේවකයන් හෝ බාහිර පාර්ශවයන් ව්‍යාපාරය සමග කටයුතු කිරීමේදී ~~විසින්~~ සිදු කරන ලද වංචනික ක්‍රියාකාරකම් හේතුවෙන් ව්‍යාපාරයට පාඩු ඇතිවීමේ අවදානම. මෙම අවස්ථාවට අනුව, විකුණුම් ප්‍රධානියා වංචාවක් සිදු කර ඇත.

- අනුකූලවීමේ අවදානම

වැදගත් නීතියක් හෝ නියාමනයකට අනුකූල වීමට අපොහොසත් වීමේ අවදානම. කර්මාන්තවල ඇති සැලකිය යුතු අවදානම් හේතුවෙන් විශේෂිත රෙගුලාසි වලට යටත් වූ ඇතැම් කර්මාන්තයන පවතී. නීති රෙගුලාසි වලට අනුකූල නොවීමේ ප්‍රතිවිපාකයක් ලෙස දඩ ගෙවීමට සිදුවීම ව්‍යාඅපාරයේ කීර්ති නාමයට හානි වීම සහ බලපත්‍ර අහෝසිවීම වැනි පාඩු ඇති කරයි. මෙම අවස්ථාවට අනුව, ව්‍යවස්ථාපිත මූල්‍ය වාර්තාකරණ කාලසීමාවන් සපුරාලීමට අපොහොසත් වීම නීතිමය සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවන බව පෙන්නුම් කරයි.

- කීර්තිනාම අවදානම

අහිතකර සිදුවීමක් හෝ ක්‍රියාමාර්ග මාලාවක් හේතුවෙන් සංවිධානය පිළිබඳව මහජනතාව තුළ ඇති හොඳ නම සහ විශ්වාසය අහිමි වීමේ අවදානම. මෙම අවස්ථාවට අනුව, වංචා සහ කාලෝචිත වාර්තාකරණ අසාර්ථකත්වයන් සමාගමේ ආයෝජකයින්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් කොටස්කරුවන් තුල සමාගම පිළිබඳව තබා ඇති කීර්ති නාමයට සහ විශ්වාසයට හානි කළ හැකිය.

(අවදානම් දෙකක් පැහැදිලි කිරීමට පමණක් අපේක්ෂා කෙරේ)

***(ලකුණු 03)***

**(b)**

- ප්‍රවණතා විශ්ලේෂණ
- පුරෝකථන විශ්ලේෂණ
- තත් කාලීන අධීක්ෂණය
- මූල හේතු විශ්ලේෂණ
- දත්ත දෘශ්‍යකරණය
- යන්ත්‍ර ඉගෙනීම සහ කෘතිම බුද්ධිය
- සංසන්දනාත්මක විශ්ලේෂණය
- අවස්ථා විශ්ලේෂණය

(ශිල්පීය ක්‍රම දෙකක් පමණක් අපේක්ෂා කරයි.)

(ලකුණු 02)

***(මුළු ලකුණු 05)***

| **A කොටසෙහි අවසානය** |
|---|

SRI LANKA

(මුළු ලකුණු 30)

**B කොටස**

## *5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

**(a)** සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනු හඳුනා ගැනීම, සමාලෝචනය කිරීම හෙළිදරව් කිරීම සහ ඔවුන් සමඟ ගනුදෙනු වලින් ඇතිවිය හැකි ඕනෑම විභව ඇල්ම මත සිදුවන ගැටුම් වැළැක්වීම සඳහා ප්‍රතිපාදන අනුමත කිරීම මෙයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මෙම ගනුදෙනු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් පාලනය කරනු ලැබේ.

***(ලකුණු 04)***

**(b)**

| | |
|---|---|
| ප්‍රසම්පාදන | • ස්වයංක්‍රීය ද්‍රව්‍ය අධියාචනය සහ අනුමැතීන්<br>• ස්වයංක්‍රීය ගැනුම් ඇණවුම් උත්පාදනය<br>• ස්වයංක්‍රීය සැපයුම්කරු සංසන්දන මෙවලම්<br>• තුන් අකාරයකට ඉන්වොයිස් ගැලපීම<br>• ගැනුම් ඇණවුම් ලුහුබැඳීම<br>• ස්වයංක්‍රීය ඉන්වොයිස් අනුමත කිරීමේ ක්‍රියාවලිය<br>• සැපයුම්කරුවන් හට ගෙවීම් ස්වයංක්‍රීයකරණය |
| වැටුප් කළමණාකරණය | • පැමිණීමේ වේලාවන් සහ පැමිණීම ඒකාබද්ධ කිරීම<br>• ස්වයංක්‍රීය වැටුප් ගණනය කිරීම<br>• වැටුප් පත්‍රිකා උත්පාදනය<br>• නිවාඩු අනුමත කිරීම් සහ වාර්තා තබා ගැනීම<br>• වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළියෙළ කිරීම<br>• වැටුප් විගණන සටහන්<br>• සේවක ස්වයං සේවා ද්වාර කළමණාකරනය සහ යාවත්කලීන කිරීම<br>• සේවා මුර සැලසුම් කිරීම ස්වයංක්‍රීයකරණය |
| මුදල් කළමණාකරණය | • බැංකු දත්ත ඒකාබද්ධ කිරීම හරහා තත් කාලීන මුදල් තත්වය නිරීක්ෂණය<br>• ස්වයංක්‍රීය බැංකු සැසඳුම්<br>• කාලසටහන්ගත ගෙවීම්<br>• මුදල් ප්‍රවාහ පුරෝකථන මෙවලම්<br>• ගෙවීම් අනුමත කිරීමේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය<br>• ගෙවීම් ද්වාර සමඟ ඒකාබද්ධ කිරීම |
| තොග කළමණාකරණය | • තොග ගනුදෙනු වාර්තා කිරීමට සහ තොග අයිතමයන් තත් කාලීනව අධීක්ෂණය කිරීම සඳහා බාර්කෝඩ් සහ QR කේත (QR Code) ස්කෑන් කිරීම.<br>• විශාල පරිමාවක තොග අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා රේඩියෝ තරංග හැඳුනුම් (RFID - Radio Frequency Identification) භාවිතය.<br>• ස්වයංක්‍රීය නැවත ඇණවුම් මට්ටම් පිහිටුවීම<br>• ගබඩා කළමනාකරණ පද්ධති<br>• ඉල්ලුම් පුරෝකථන ඇල්ගොරිතම් |

| | |
|---|---|
| | • සම්මත තොග පාලන මට්ටම් සමග ස්වයංක්‍රීය තොග සංසන්දනය කිරීම<br>• ස්වයංක්‍රීය තොග ගණනය කිරීම<br>• ස්වයංක්‍රීය දැනුම්දීම් සහ ඇඟවීම් - ගබඩා කළමනාකරුට භාණ්ඩ හිඟය, අධික ගබඩා කිරීම, හෝ කල් ඉකුත් වීම පිළිබඳ දැනුම්දීම සඳහා |
| **දේපල, පිරියත සහ උපකරණ** කළමණාකරණය | • වත්කම් අයිතම සඳහා බර්කොඩ් හඳුන්වා දීම<br>• වත්කම් පන්තිය මත පදනම්ව ස්වයංක්‍රීය ක්ෂය ගණනය කිරීම<br>• ස්වයංක්‍රීය නඩත්තු කාලසටහන් නඩත්තු අංශ දැනුවත්කිරීම්<br>• ප්‍රාග්ධන වියදම් (CapEx) අනුමත කිරීමේ ක්‍රියාවලීන්<br>• වත්කම් ඉවත් කිරීම සහ ප්‍රත්‍යාගණනය නිරීක්ෂණය කිරීම<br>• වත්කම් භාවිතය නිරීක්ෂණය කිරීම |

***(ලකුණු 03)***

**(c)**

- විශේෂඥතාව ඇති වෘත්තිකයන්ගේ හිඟය
- ගුණාත්මක භාවයෙන් දුර්වල දත්ත සහ පෞද්ගලිකත්ව ගැටළු /නොහැකියාවන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට බාධා කරයි
- යාවත්කාලීන කිරීම් සහ නව පද්ධති පවතින පද්ධති සමඟ අනුකූල නොවිය හැකිය
- මෙම නව තාක්ෂණයෙන් සන්නද්ධ පද්ධතින් බොහෝ විට සයිබර් ආරක්ෂණ තර්ජනවලට ගොදුරු විය හැකිය.
- දැනට සිටින සේවකයින් නව පද්ධති අනුගමනය කිරීමට අකමැති විය හැකි බැවින් වෙනස්කම් කළමනාකරණ පිළිබඳ අභියෝග.
- සේවකයන්ගේ කුසලතා පරතරය.
- අනුකූලතා අවදානම්.
- පරිමාණය සහ නඩත්තුව
- මෙම තාක්ෂණයන් සංවර්ධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා සාමාන්‍යයෙන් සැලකිය යුතු ආයෝජනයක් අවශ්‍ය වේ.

(අභියෝග තුනක් පමණක් අපේක්ෂා කෙරේ)

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

## *6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| **පරිච්ඡේදය** 03 |
|---|

**(a)**

- **අවදානම් අවම කිරීම**

  සමාගමක අවදානම් මට්ටම පිළිගත හැකි මට්ටමට වඩා ඉහල යැයි හැඟුන විට එය අවම මට්ටකට ගෙන ඒමට කළමණාකාරීත්වයට තීරණය කල හැක.
  සමාගමට තම ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමෙන්, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙන් සහ නව වෙළඳපල හෝ සේවා සඳහා ආයෝජනය කිරීමෙන් අවදානමේ බලපෑම හෝ විය හැකි සම්භාවිතාව අඩු කළ හැකිය. මෙම ව්‍යාපාරය තනි ගනුදෙනුකරුවෙකු (රජයේ ව්‍යාපෘති) මත යැපීම අඩු කරයි, එය දැනට ආදායමෙන් 87% ක් වේ.

- **අවදානම් පැවරීම**
  අවදානම් පැවරීම යනු එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට සම්පූර්ණ අවදානමක් ගිවිසුම්ගතව මාරු කිරීම පදනම් කර ගත් අවදානම් කළමනාකරණ සහ පාලන උපාය මාර්ගයකි.

  හවුල් ව්‍යාපාර, උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ සුදුසු රක්ෂණ විධිවිධාන හරහා සමාගමට අවදානම් පැවරීමට හෝ බෙදා ගැනීමට හැකිය. මෙය සමාගමට අනෙකුත් පාර්ශවයන් සමඟ මූල්‍ය හා මෙහෙයුම් අවදානම් බෙදා ගැනීමට සහ අනපේක්ෂිත පාඩු වල අහිතකර බලපෑම අඩු කිරීමට ඉඩ සලසයි.

- **අවදානම් වළක්වා ගැනීම:**
  අවදානම් වළක්වා ගැනීම යනු සංවිධානයක වත්කම්වලට අහිතකර ලෙස බලපෑ හැකි උපද්‍රව, ක්‍රියාකාරකම් සහ නිරාවරණයන්ගෙන් ඉවත් කිරීමයි.

  උදාහරණයක් ලෙස, සීමාසහිත High Path Constructions සමාගම රජයේ ප්‍රතිපත්ති වෙනස්කම් වලට නිරාවරණය නොවන පරිදි සමාගම පෞද්ගලික ඉදිකිරීම් ව්‍යාපෘති හෝ වෙනත් යටිතල පහසුකම් අංශවලට විවිධාංගීකරණය කළ හැකිය.

- **අවදානම් භාරගැනීම:**
  අවදානම් පිළිගැනීම හෝ අවදානම් භාර ගැනීම යන්නෙන් අදහස් කරන්නේ හඳුනාගත් අවදානම පිළිගැනීම සහ අවදානම අඩු කිරීම සඳහා වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමයි.
  මෙම අවස්ථාවේදී, සීමාසහිත High Path Constructions සමාගම රජයේ ව්‍යාපෘති මත යැපීම පිළිගත හැකි නමුත්, අවදානම ඇති වුවහොත් විභව පාඩු කළමනාකරණය කිරීම සඳහා හදිසි සැලසුම් සකස් කරන අතරතුර මෙහෙයුම් දිගටම කරගෙන යාමට තීරණය කරයි.

(ක්‍රම දෙකක් පමණක් අපේක්ෂා කෙරේ)

***(ලකුණු 04)***

**(b)**

- සයිබර් ආරක්ෂණ අවදානම්
- දත්ත රහස්‍යතාව සහ අනුකූලතා අවදානම්
- තාක්ෂණ ඒකාබද්ධ කිරීමේ අසාර්ථකත්වය
- තාක්ෂණය මත අධික ලෙස යැපීම
- කුසලතා හිඟය මත ඇති අවදානම

***(ලකුණු 03)***

**(c)** අවදානම් තක්සේරුව යනු අවදානම් හඳුනා ගැනීමේ සහ ඒවා ඇගයීමේ ක්‍රියාවලිය වන අතර එමගින් සංවිධානයට එහි වැදගත්කම සහ විභව බලපෑම තීරණය වේ. මෙම ක්‍රියාවලිය අවදානම් ප්‍රමුඛතා කිරීමට සහ සුදුසු අවම කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීමට උපකාරී වේ.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 10)***

## *7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| පරිච්ඡේදය 02 සහ 03 |
|---|

**(a)**

- ව්‍යාපාරවලට තිරසාරභාවය තක්සේරු කිරීම් නිතර සිදු කිරීම.
- සියලුම ක්‍රියාවලීන් පරිසර හිතකාමී ආකාරයකින් සිදු කරන බවට සහතික වීම.
- බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිතා කර කාර්ය

ප්‍රවාහය ප්‍රශස්ත කිරීම.

- අපද්‍රව්‍ය නිෂ්පාදනය අවම කිරීම සඳහා හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට වග බලා ගැනීම.
- වැරදි අඩු කිරීමට, නිරවද්‍යතාවය වැඩි කිරීමට සහ සම්පත් නාස්තිය අඩු කිරීමට කෘතීම බුද්ධිය (AI), යන්ත්‍ර ඉගෙනුම් (ML), රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA) වැනි ඩිජිටල් මෙවලම් සමඟ ඒකාබද්ධ කිරීම.
- ගෝලීය වාර්තාකරණ මුලපිරීම් (GRi) හෝ වෙනත් කර්මාන්ත-විශේෂිත තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතීන් සහ වාර්තාකරණ රාමු සමඟ පෙළ ගැසීම.
- තිරසාර භාවිතයන් පිළිබඳව සේවකයින් පුහුණු කිරීම.
- අඛණ්ඩ අධීක්ෂණය.
- සාධාරණ වෙළඳ සැපයුම්කරුවන් තෝරාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
- සැපයුම්කරුවන්ගේ තිරසාරභාවය ඇගයීම සහ තෝරා ගැනීම.
- පරිසර හිතකාමී පිළිවෙත් අනුගමනය කරන සැපයුම්කරුවන්ගෙන් පාරිසරික ද්‍රව්‍ය මිලදී ගැනීම.

(භාවිතයන් දෙකක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 02)***

**(b)**

- වැදගත් තොග අයිතම හිඟ වීමේ අවදානම
- අධික තොග මට්ටම්වල අවදානම
- තොග සඳහා භෞතික අවදානම
- තොග වාර්තාවල වැරදි ඇතිවීමේ අවදානම
- ඇණවුම් විස්තර සමග නොගැලපෙන භාණ්ඩ පිළිගැනීමේ අවදානම
- තොග නොලැබිය යුතු පුද්ගලයින්ට තොග නිකුත් කිරීමේ අවදානම.
- තොග සොරකම් කිරීම හෝ අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ අවදානම.
- තොග හානි හෝ සම්මත තත්වයන්ගෙන් බැගැර වීම පිළිබඳ අවදානම.
- තොග යල් පැන යාම හෝ කල් ඉකුත් වීම පිළිබඳ අවදානම.

(අවදානම් හතරක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 04)***

**(c)**

- සැලසුම් කිරීමේ දුර්වලතාවය
- මානව දෝෂ
- සේවකයින් අතර කුමන්ත්‍රණය
- සම්පත්වල සීමාවන්
- ව්‍යාපාර මෙහෙයුම්වල සංකීර්ණත්වය
- වෙනස් වීමට ප්‍රතිරෝධය
- කළමනාකරණය අභිබවා යෑම

(සීමා හතරක් පමණක් අපේක්ෂා කෙරේ.)

*(ලකුණු 04)*

***(මුළු ලකුණු 10)***

| ***B* කොටසෙහි අවසානය** |
|---|

aat SRI LANKA

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

**පරිච්ඡේදය 03**

**(a)**

**(i)** අවදානම් රුචිය යනු ආයතනය තම අරමුණු කරා යාමේදී ආයතනයක් විසින් පිළිගැනීමට කැමති අවදානම් ප්‍රමාණයයි. එබැවින්, සංවිධානයේ අවදානම් රුචිය එහි උපාය මාර්ග සමග සමපාත විය යුතුය.

***(ලකුණු 03)***

**(ii)**

- පාලනය සහ සංස්කෘතිය
- උපායමාර්ගය සහ අරමුණු ස්ථාපිත කිරීම
- කාර්ය සාධනය
- සමාලෝචනය සහ සංශෝධනය
- තොරතුරු, සන්නිවේදනය සහ වාර්තාකරණය

(මූලිකාංග හතරක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 04)***

**(b)**

1) අවදානම් උත්සන්න වීමට පෙර ඒවා ආමන්ත්‍රණය කිරීමෙන් මූල්‍ය, මෙහෙයුම් සහ කීර්ති නාම අවදානම් හරහා වන පාඩු අවම කිරීම.
2) පැහැදිලි අවදානම් අවම කිරීමේ සැලැස්මක් සමග, විභව අවදානම් සහ ඒවායේ බලපෑම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් මත පදනම්ව සංවිධානවලට දැනුවත් තීරණ ගත හැකිය.
3) ව්‍යාපාර ක්‍රියාවලීන්හි අකාර්යක්ෂමතා හෝ විභව බාධා හඳුනාගෙන ඉවත් කිරීමෙන් මෙහෙයුම් විධිමත් කර ගත හැක.
4) අනපේක්ෂිත සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමට සහ අවම බාධා කිරීම් සහිතව මෙහෙයුම් දිගටම කරගෙන යාමට වඩා හොඳින් සන්නද්ධ විය හැකිය.
5) නීතිමය ගැටළු සහ දඩුවම් වළක්වා ගනිමින් අදාළ නීති, රෙගුලාසි සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වීම.
6) අවදානම් වලට කල්තියා මුහුණ දීමෙන්, සංවිධාන පාර්ශ්වකරුවන් කෙරෙහි වගකීම සහ කැපවීම පෙන්නුම් කරයි, ඔවුන්ගේ කීර්ති නාමය ඉහළ නංවයි සහ ගනුදෙනුකරුවන්, ආයෝජකයින් සහ හවුල්කරුවන්ගෙන් විශ්වාසය ලබා ගනී.
7) වළක්වා ගත හැකි සිදුවීම් හෝ අනතුරු වළක්වා ගැනීමෙන් දිගුකාලීන අධික පිරිවැය ඉතිරිකිරීම්.
8) අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, සේවකයින් සහ පාර්ශ්වකරුවන් විභව අභියෝග සඳහා හොඳින් සූදානම් බව සහතික කිරීම.
9) සමස්ත ඵලදායිතාව සහ අවධානය වැඩි දියුණු කරමින්, වඩාත්ම වැදගත් ක්ෂේත්‍රවලට සම්පත් වඩාත් කාර්යක්ෂමව වෙන් කළ හැකිය.
10) අවිනිශ්චිත පරිසරයන් තුළ පවා සුමටව ක්‍රියාත්මක වීමේ හැකියාව පෙන්නුම් කිරීමෙන් තරඟකාරී වාසියක් ලබා ගනී.

(වාසි හතරක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 04)***

**(c)**

**1) වංචා හඳුනා ගැනීම සහ වැළැක්වීම:**

රුපියල් මිලියන 315.122 ක රසායනාගාර සේවා ආදායම සහ රුපියල් මිලියන 60.327 ක ඖෂධ අලෙවි ආදායම සම්බන්ධයෙන් හට ගැනෙන අසාමාන්‍ය හෝ සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන්ට කෘතීම බුද්ධිය සහ දත්ත විශ්ලේෂණ භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, කෘතීම බුද්ධිය මගින් අනුපිටපත් ඉන්වොයිසි, නිසි අවසරයකින් තොරව දුන් වට්ටම්, අවලංගු කරන ලද විකුණුම් හෝ අනුරූප බිල්පත් වාර්තා නොමැතිව සිදු කරන ලද රසායනාගාර පරීක්ෂණ හඳුනා ගත හැකිය. මෙය විගණකවරුන්ට විභව වංචා හඳුනා ගැනීමට සහ ආදායම නිවැරදිව සටහන් කර ඇති බව සත්‍යාපනය කිරීමට උපකාරී වේ.

**2) අවදානම් තක්සේරුව සහ විශ්ලේෂණය:**

ආදායම් ප්‍රවණතා විශ්ලේෂණය කිරීමට සහ ඉහළ අවදානම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන්ට කෘතීම බුද්ධිය සහ දත්ත විශ්ලේෂණ භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, රසායනාගාර සේවා ආදායමේ අසාමාන්‍ය උච්චාවචනයන්, ඖෂධ අලෙවියේ අනපේක්ෂිත පහත වැටීම් හෝ අසාමාන්‍ය ගනුදෙනු රටා සඳහා ඔවුන්ගේ අවධානය යොමු කිරීම ඔස්සේ වැරදි හෝ සාවද්‍ය ප්‍රකාශයන් පෙන්නුම් කළ හැකිය. ආදායමේ නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සත්‍යාපනය කිරීම සඳහා විගණකවරුන්ට මෙම ක්ෂේත්‍රවල විගණන ක්‍රියා පටිපාටි සිදු කළ හැකිය.

**3) අඛණ්ඩ විගණනය සහ අධීක්ෂණය:**

වසර පුරා රසායනාගාර සහ ඖෂධ අලෙවි ගනුදෙනු අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට අභ්‍යන්තර විගණකවරුන්ට දත්ත විශ්ලේෂණ මෙවලම් භාවිතා කළ හැකිය. පද්ධතියට ස්වයංක්‍රීයව රසායනාගාර පරීක්ෂණ වාර්තා, නිකුත් කරන ලද ඉන්වොයිසි සමග සහ ඖෂධ අලෙවියෙන් මුදල් ලැබීම්තො, චලනයන් සමග සංසන්දනය කළ හැකිය. ඕනෑම විෂමතාවයක් විමර්ශනය සඳහා වහාම සලකුණු කළ හැකි අතර, ආදායම සම්පූර්ණ හා නිවැරදිව වාර්තා කර ඇති බව සහතික කිරීමට උපකාරී වේ.

**4) නිතර සිදු කරන විගණන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම:**

අභ්‍යන්තර විගණකවරුන්ට රසායනාගාර පරීක්ෂණ වාර්තා, බිල්පත් දත්ත සහ ඖෂධ අලෙවි ගනුදෙනු සමග ගිණුම්කරණ වාර්තා ස්වයංක්‍රීයව සංසන්දනය කිරීමට කෘතීම බුද්ධියෙන් බලගැන්වූ පද්ධති භාවිතා කළ හැකිය. ස්වයංක්‍රීයකරණය හස්තමය කාර්යයන් සහ මානව දෝෂ අඩු කරන අතරම විගණකවරුන්ට විශාල ගනුදෙනු සංඛ්‍යාවක් පරීක්ෂා කිරීමට ඉඩ සලසයි, එමඟින් ආදායම් සත්‍යාපනයේ විශ්වසනීයත්වය වැඩි දියුණු කරයි.

**5) විගණන සැලසුම් කිරීම සහ විෂය පථය වැඩි දියුණු කිරීම:**

අභ්‍යන්තර විගණකවරුන්ට වැඩි විගණන අවධානයක් අවශ්‍ය ආදායම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කෘතීම බුද්ධි සහ දත්ත විශ්ලේෂණ භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, දත්ත විශ්ලේෂණය අසාමාන්‍ය රසායනාගාර ආදායම් ප්‍රවණතා හෝ ඖෂධ අලෙවි ගැලපුම් වෙනස්කිරීම් විශාල සංඛ්‍යාවක් පෙන්නුම් කරන්නේ නම්, විගණකවරුන්ට මෙම ක්ෂේත්‍ර සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කළ හැකිය. මෙය රසායනාගාර සේවා ආදායම සහ ඖෂධ අලෙවි ආදායම පිළිබඳ වඩාත් අවධානය යොමු වන පරිදි ඵලදායී විගණනයක් සක්‍රීය කරයි.

(ක්‍රම දෙකක් පැහැදිලි කිරීම පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 04)***

**(d)**

- ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය සඳහා.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා. .
- මෙහෙයුම්වල ආර්ථිකය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සමාලෝචනය සඳහා. කරන්න.
- අනුකූලතාව සමාලෝචනය සඳහා. කරන්න.

- වත්කම් ආරක්ෂා කිරීම සහ සමාලෝචනය සඳහා. කරන්න.
- ආයතනික අරමුණු ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය සමාලෝචනය සඳහා. කරන්න.
- ව්‍යාපාර සහ මූල්‍ය අංශ වල සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම.
- සැක සහිත වංචා වැනි වැඩි අවදානම් සහිත ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ විමර්ශන සිදුකිරීම සඳහා.

(අවදානම් තුනක් පමණක් දැක්වීම අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 03)***

**(e)**

**1) හුරුපුරුදු බව පිළිබඳ තර්ජනය**

විගණන සමාගමේ හවුල්කරුවෙකු වන සමන්ති මීට පෙර රනිල්ගේ විගණන ආයතනයේ ඇගේ විගණන පුහුණුව සම්පූර්ණ කළ අතර රනිල් දැන් සීමාසහිත මෙඩි ලැබ් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයකි. මෙම පෙර පැවති සමීප වෘත්තීය සම්බන්ධතාවය හුරුපුරුදු බව පිළිබඳ තර්ජනයක් ඇති කළ හැකි අතර, සමන්ති හෝ විගණන කණ්ඩායම රනිල් හෝ කළමනාකාරිත්වය කෙරෙහි අනවශ්‍ය පරිදි අනුකම්පා සහගත විය හැකි අතර ඔවුන්ගේ වෘත්තීය විනිශ්වයභාවය අඩු වීමට හේතු වේ.

**2) බිය ගැන්වීමේ තර්ජනය**

විගණන කටයුතු අලුත් කිරීම සඳහා අඛණ්ඩ සහයෝගීතාවයක් සහ නම්‍යශීලී බවක් අපේක්ෂා කරන බවට කළමනාකාරිත්වයේ ඇඟවීම බියගැන්වීමේ තර්ජනයක් ඇති කළ හැකිය. සේවාදායකයා අහිමි වීමේ බිය නිසා කළමනාකරණයට අභියෝග කිරීමෙන් හෝ විවාදාත්මක කරුණු වාර්තා කිරීමෙන් වැළකී සිටීමට විගණකවරයාට පීඩනයක් දැනිය හැකිය.

**3) ස්වයං-ඇල්ම පිළිබඳ තර්ජනය**

SA ඇසෝසියේට්ස් වෙත විගණන කටයුතු රඳවා තබා ගැනීමට සහ දීර්ඝ කිරීමට උනන්දුවක් ඇති බැවින් එය ස්වයං-උනන්දුවට තර්ජනයක් ද ඇති කළ හැකිය. මෙය අරමුනුගතභාවය සහ වෘත්තීය සැකය අවදානමට ලක් කළ හැකිය.

(තර්ජන දෙකක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 04)***

**(c)**

පහත සඳහන් ආරක්ෂණ ක්‍රම මගින් තර්ජන පිළිගත හැකි මට්ටමකට ඉවත් කිරීමට හෝ අඩු කිරීමට හැකිය:

1) බලපෑමට ලක් වූ විගණන කාර්ය මණ්ඩලය වෙනස් කිරීම හෝ ඉවත් කිරීම
2) සමන්තී රනිල් සමඟ පැවති පෙර සම්බන්ධතාවය සැලකිය යුතු හුරුපුරුදු බව පිළිබඳ තර්ජනයක් ඇති කරන්නේ නම් ඇය විගණනයට සම්බන්ධ නොවිය යුතුය. තවත් ස්වාධීන හවුල්කරුවෙකුට කාර්යාභාරය සමාලෝචනය කිරීමට හෝ මෙහෙයවීමට හැකිය.
3) ස්වාධීන කර්යභාරයේ ගුණාත්මකභාවය/පාලන සමාලෝචනය
4) විශේෂයෙන් සැලකිය යුතු විනිශ්වයන්, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ යෝජිත විගණන මතය සඳහා විගණනයට සම්බන්ධ නොවන සුදුසුකම් ලත් හවුල්කරුවෙකු විසින් ස්වාධීන සමාලෝචනයක් පැවැත්වීම.
5) ස්වාධීනත්වය සහ පාලන අධීක්ෂණය ශක්තිමත් කිරීම.
6) ස්වාධීන අභ්‍යන්තර විගණන කණ්ඩායම අධ්‍යක්ෂක මණ්ඩලය හෝ පාලනයට වග කිව යුතු පාර්ශවයන් සමඟ ස්වාධීනත්වය පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම, සහ විගණන කාර්යභාරය සහ ඕනෑම අලුත් කිරීමක් කළමනාකරණ පීඩනයට වඩා වෘත්තීය සලකා බැලීම් මත පදනම් වන බව සහතික කිරීම.
7) මූලික මූලධර්මවලට අනුකූල වීමේ වැදගත්කම අවධාරණය කරන සමාගමේ නායකත්වය.
8) කාර්යභාරයන්හි තත්ත්ව පාලනය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.

9) මූලික මූලධර්මවලට අනුකූල වීමට ඇති තර්ජන හඳුනා ගැනීමේ අවශ්‍යතාවය, එම තර්ජනවල වැදගත්කම ඇගයීම සහ තර්ජන තුරන් කිරීම හෝ අඩු කිරීම සඳහා ආරක්ෂණ ක්‍රම යෙදීම පිළිබඳ ලේඛනගත ප්‍රතිපත්ති.

10) මූලික මූලධර්මවලට අනුකූල වීම අවශ්‍ය වන ලේඛනගත අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.

11) සමාගම හෝ කාර්යභාර කණ්ඩායම්වල සාමාජිකයින් සහ සේවාදායකයින් අතර අවශ්‍යතා හෝ සබඳතා හඳුනා ගැනීමට හැකි වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි.

(ක්‍රම තුනක් පමණක් අපේක්ෂා කෙරේ.)
*(ලකුණු 03)*

***(මුළු ලකුණු 25)***

## *9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :*

| **පරිච්ඡේදය 03 සහ 05** |
|---|

### (a)

සීමාසහිත මැජිකල් සමාගමෙහි විගණන ක්‍රියාවලිය සිදුකිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය:

1. තොගයේ ලුහුකම් ක්‍රියාවලිය සහ තක්සේරු කිරීම - 2026 මාර්තු 31 දිනට පෙර යවන ලද රුපියල් මිලියන 3 ක් වටිනා භාණ්ඩ 2026 අප්‍රේල් මාසයේදී වාර්තා කරන ලදී. මෙය ලුහුකම් ක්‍රියාවලියේ දෝෂයක් පෙන්නුම් කරන අතර වැරදි තොග අගයන් සහ විකුණුම් පිරිවැයට හේතු විය හැක.
2. වෙළඳ ලැබිය යුතු මුදල් සහ හානිකරණය - සමාගම සතුව නිසි හානිකරණ ආකෘතියක් නොමැති අතර, විගණනයේදී සිදු කරන ලද නැවත ගණනය කිරීමේදී රුපියල් මිලියන 1.8 ක වෙළඳ ලැබීම් මත ඌන ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත. එබැවින්, හානිකරණ දීමනාවේ ප්‍රමාණවත් බව පිළිබඳව විශේෂ අවධානයක් අවශ්‍ය වේ.
3. අයභාරය හඳුනා ගැනීම - අයභාරය හඳුනා ගැනීමට අදාලව සැලකිය යුතු වංචා අවදානමක් පවතී. මක්නිසාද යත් , විකුණුම් කාර්ය මණ්ඩලයට ආදායම් ඉලක්ක මත පදනම්ව දිරිගැන්වීම් ලැබෙන බැවින් ආදායම නිවැරදි කාලපරිච්ඡේදයෙන් තොරව හඳුනා ගැනීමට පීඩනයක් ඇති කරයි.
4. කළමනාකරණ ආකල්පය සහ අභ්‍යන්තර පාලනයන් - අභ්‍යන්තර පාලනයන් සහ අනුකූලතාවයන් නොසලකා, කළමනාකරණය ආදායම් වර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. මෙය කළමනාකරණ අභිබවා යාම, වංචාව සහ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ කිරීමේ අවදානම වැඩි කරයි.
5. සමාගම විසින් අඛණ්ඩව පාඩු ලබනු ඇත
6. සමාගම දුර්වල අභ්‍යන්තර පාලනයන් සහ නීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමට හේතු වේ.
7. ගෙවන ලද දිරි දීමනා.

(ක්‍රම 4ක් පමණක් අපේක්ෂා කෙරේ.)
***(ලකුණු 04)***

### (b)

වංචා සහ අවදානම් සාධක යනු වංචාවක් සිදු කිරීමට/අවස්ථාවක් ලබා දීමට දිරිගැන්වීමක්/පීඩනයක් පෙන්නුම් කරන සිදුවීම් සහ කොන්දේසි වේ.
අයභාරය හඳුනා ගැනීම සැලකිය යුතු අවදානමක් ලෙස සලකනු ලබන්නේ:

1. කළමනාකරණ පීඩනය සහ දිරිගැන්වීම් - විකුණුම් කාර්ය මණ්ඩලයට ආදායම් ඉලක්ක සපුරා ගැනීම මත පදනම්ව දිරිගැන්වීම් ලැබෙන අතර, එය නිසි කාලපරිච්ඡේදයෙන් තොරව හෝ වැරදි ලෙස අයභාරය වාර්තා කිරීමට දිරිගැන්වීමක් නිර්මාණය කරයි.
2. කලින් බිල් කර රඳවා ගැනීමේ විධිවිධාන - භාණ්ඩ තවමත් පාරිභෝගිකයාට ලබා දී නොමැති

වුවද අයභාරය හඳුනාගත හැකිය. මෙය අයභාරය හඳුනා ගැනීම සඳහා කොන්දේසි සපුරා නොමැති බවට අවදානමක් ඇති කරයි.

3. බෙදාහරින්නන් වෙත යවන ලද අමතර නිෂ්පාදන - වාර්තා කරන ලද විකුණුම් වැඩි කිරීම සඳහා බෙදාහරින්නන් වෙත අමතර නිෂ්පාදන යැවීම නාලිකා පිරවීමක් නියෝජනය කළ හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කල්පිත හෝ නිසි කාලපරිච්ඡේදයෙන් තොරව අයභාරය හඳුනා ගැනීම හේතුවෙන් අයභාරය සහ ලාභය අධිප්‍රකාශනය සිදු විය හැකිය.

එබැවින්, වංචනික අයභාරය හඳුනා ගැනීම සහ කළමනාකරණය පාලනයන් අභිබවා යාමේ අවදානම වැඩි වේ.

***(ලකුණු 03)***

**(c)**

- මූල්‍ය ප්‍රකාශනවල අංග
- පරිශීලකයින් අවධානය යොමු කිරීමට නැඹුරු වන අයිතම තිබේද යන්න
- ආයතනයේ ස්වභාවය, කර්මාන්තය සහ ආර්ථික පරිසරය
- ආයතනයේ හිමිකාරීත්ව ව්‍යුහය සහ මූල්‍යකරණය
- මිණුම් ලකුණෙහි සාපේක්ෂ විචල්‍යතා

(සාධක තුනක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 03)***

**(d)**

වංචා වැළැක්වීම සහ අනාවරණය කිරීම සම්බන්ධයෙන් සීමාසහිත මැජිකල් සමාගමෙහි කළමනාකාරිත්වය මූලික වගකීම දරයි. කළමනාකරණය විසින් කළ යුත්තේ:

1. වංචා සහ වැරදි වැළැක්වීම සහ අනාවරණය කිරීම සඳහා නිර්මාණය කරන ලද ඵලදායී අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.
2. අවංකභාවය, අඛණ්ඩතාව සහ නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්ති ඇතුළුව, සදාචාරාත්මක සංස්කෘතියක් සහ මේ සඳහා කළමණාකාරීත්වයේ අව්‍යාජ කැපවීම පෙන්වන ආකාරයට කටයුතු කිරීම.
3. වංචා අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීම සහ අයභාරය හඳුනා ගැනීම සහ විකුණුම් දිරිගැන්වීම් පාලනය කිරීම ඇතුළුව, එම අවදානම් අවම කිරීම සඳහා සුදුසු පාලනයන් ක්‍රියාත්මක කිරීම.
4. අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව නිරීක්ෂණය කිරීම සහ දුර්වලතා හෝ සැක සහිත වංචා හඳුනාගත් විට සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.

***(ලකුණු 04)***

**(e)** ABC ඇසෝසියේට්ස් විසින් පහත ක්‍රියා පටිපාටි ඇතුළුව, විගණන ක්‍රියා පටිපාටි සිදු කළ යුතුය:

1. අයභාරය නිවැරදි ගිණුම්කරණ කාල සීමාව තුළ හඳුනාගෙන තිබේද යන්න තීරණය කිරීමට, 2026 මාර්තු 31 දිනට පෙර සහ පසු විකුණුම් ඉන්වොයිසි, භාණ්ඩ නිකුත් කිරීමේ සටහන් සහ බෙදාහැරීමේ ලේඛන පරීක්ෂා කිරීමෙන් ලුහුකම් පරීක්ෂණ සිදු කිරීම.
2. බිල්පත් සහ රඳවා ගැනීමේ ගනුදෙනු පරීක්ෂා කර අයභාරය හඳුනා ගැනීමට පෙර අදාළ අයභාරය හඳුනාගැනීමේ නිර්ණායක සපුරා ඇත්දැයි තහවුරු කිරීම.
3. විශේෂයෙන් සැලකිය යුතු සහ අසාමාන්‍ය වසර අවසාන ගනුදෙනු සඳහා, වෙළඳ ලැබිය යුතු දේ සහ විකුණුම් ශේෂයන් තහවුරු කිරීම.
4. කල්තියා අයභාරය හඳුනා ගැනීම් හෝ කල්පිත ආදායම් හඳුනාගැනීම් හඳුනා ගැනීම සඳහා වසර අවසානයෙන් පසු නිකුත් කරන ලද පසුකාලීන විකුණුම් සහ බැර සටහන් පරීක්ෂා කිරීම.
5. ඉන්වොයිස් කරන ලද ප්‍රමාණයන් පාරිභෝගිකයින් විසින් සැබවින්ම ඇණවුම් කරන

ලද/පිළිගත් ප්‍රමාණයන් සමග සංසන්දනය කිරීම සහ නාලිකා පිරවීම සිදුවී ඇත්දැයි තක්සේරු කිරීම ඇතුළුව අසාමාන්‍ය විකුණුම් ගනුදෙනු සහ බෙදාහරින්නන්ට සපයන ලද අතිරේක භාණ්ඩ විමර්ශනය කිරීම, .

6. විකුණුම් සඳහා විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි සිදු කිරීම.
7. නිසි හඳුනා ගැනීමේ නිර්ණායක සඳහා කොන්ත්‍රාත්තු සමාලෝචනය කිරීම, විශේෂයෙන් පාලනය පාරිභෝගිකයින් වෙත මාරු වූයේ කුමන අවස්ථාවේද යන්න හඳුනා ගැනීමට.
8. සාමාන්‍ය ක්‍රියාවලියට බාහිරව යොදන ලද ජර්නල් සටහන් නිසි පරීක්ෂාවට ලක් ඒ හරහා ඇති විය හැකි අවදානම් අවම කිරීම
9. ඉන්වොයිසිවලට එරෙහිව පසුකාලීන ගෙවීම් පරීක්ෂා කිරීම.
10. භාණ්ඩ නිකුත් කිරීමේ සටහන සහ පාරිභෝගිකන් විසින් භාණ්ඩ ලැබුණු බවට තහවුරු කිරීම් සමග ඉන්වොයිසි ගැලපීම.

(ක්‍රියා පටිපාටි පහක් පමණක් අපේක්ෂා කෙරේ.)

***(ලකුණු 05)***

**(f)**

- තොග සඳහා ලුහුකම් පරීක්ෂාව
  රු. මිලියන 3 ක තොග ලුහුකම් දෝෂය සමස්ත ප්‍රමාණාත්මකභාවය වන රුපියල් මිලියන 2.5 ඉක්මවයි. කළමනාකරණය එය නිවැරදි කිරීම ප්‍රතික්ෂේප කරන බැවින්, එය ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශනයක් නියෝජනය කරයි.

- වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා හානිකරණය
  රු. මිලියන 1.8 ක අඩු ප්‍රතිපාදනය තනි තනිව ගත් කළ රු. මිලියන 2.5 ක ප්‍රමාණාත්මක මට්ටමට වඩා අඩුය. කෙසේ වෙතත්, එය අනෙකුත් නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශන සමඟ සලකා බැලිය යුතුය.

- විගණන වාර්තාවට සමස්ත බලපෑම
  හඳුනාගත් මුළු සාවද්‍ය ප්‍රකාශන වන්නේ:
  රු. මිලියන 3.0 + රු. මිලියන 1.8 = රු. මිලියන 4.8
  රු. මිලියන 4.8 රු. මිලියන 2.5 ට වඩා වැඩි බැවින්, සමස්ත බලපෑම ප්‍රමාණාත්මක වේ.
  එබැවින්, කළමනාකරණය විසින් අවශ්‍ය ගැලපීම් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, විගණකවරයාට සාමාන්‍යයෙන් විකරණය කළ මතයක් නිකුත් කිරීමට අවශ්‍ය වනු ඇත.

නිවැරදි නොකළ මුළු ප්‍රමාණාත්මකභාවය රු. මිලියන 4.8 ක් වන බැවින්, එය සමස්ත ප්‍රමාණාත්මකභාවය රු. මිලියන 2.5 ඉක්මවයි. මිලියන 2.5 ක් වන අතර, කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශන වල නියමිත ගැලපීම් කිරීම ප්‍රතික්ෂේප කරන බැවින්, සාවද්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක නමුත් පෘථුල නොවන අවස්ථාවක, විකරණය කල මතයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් 'ඊක ඇසෝසියේට්ස් සලකා බැලිය යුතුය.

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 25)***

**C කොටසෙහි අවසානය**

## ***Notice:***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

SRI LANKA

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*